# පැල්පත් දරුවන් ජනප්‍රිය පාසලකට දැමීමේදී සිදුවන අසාධාරණකම් තුරන්විය යුතුයි

## කොළඹ නගරාධිපතිධුර අපේක්ෂක මිලින්ද මොරගොඩ කියයි

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය වේගයෙන් වෙනස් වෙමින් තිබෙනවා. දරුවන් ජනප්‍රිය පාසැලකට ඇතුළත් කරන්න මේ ක්‍රමය තුළ ඇත්තේ විශාල තරගයක්. මේ නිසාම පවත්නා ක්‍රමය දූෂිතවීම වැළැක්විය නොහැකි බව පෙනෙනවා. තමන්ගේ දරුවා හොඳ පාසලකට ඇතුළත් කරගන්නට නොහැකිවන ඕනෑම මාපියෙකුට මේ ක්‍රමය ගැන වෛරයක් ඇතිවෙනවා. ඒ නිසා පවත්නා ආසාධාරණකම් තුරන් විය යුතුයි. කොළඹ එක්සත් ජනතා නිදහස් සන්ධාන පුරපති අපේක්‍ෂක මිලින්ද මොරගොඩ මහතා පැවසීය.

මිලින්ද මොරගොඩ මහතා මේ බව ප්‍රකාශ කළේ නැගෙනහිර කොළඹ ප්‍රදේශයේ සංචාරය කරමින් ජනතාව සමග පැවැති සංවාදශීලී ජන හමුව අමතමිනි.

එහිදී අදහස් දැක්වූ මොරගොඩ මහතා මෙසේද කීය.

ජනප්‍රිය පාසල් අසල පැල්පතේ ජීවත්වන දරුවන්ට එහි උරුමය අහිමිවීම කනගාටුවට කරුණක්. ඉඩම් කැල්ලට අයිතියක් නැති නිසා දරුවාට පාසලක් නැහැ. නිවාසය වෙනුවෙන් ඇති කාඩ් පතට ලකුණු ලැබෙන්නේ නැහැ. අලුත් පාසල් වාරය එළැඹෙන විට හැමදාම දේශපාලඥයන් හමුවෙන්න යන මාපියන්ට ගැලපෙන සාධාරණ උත්තරයක් හදන්න අපි දැන් සූදානම් විය යුතුයි.

.අධ්‍යාපන ක්‍රමය වේගයෙන් වෙනස් වෙනවා. ජනප්‍රිය පාසලට ඇතුළුවන්න ඇත්තේ විශාල තරගයක්. මේ නිසා ක්‍රමය දූෂිතවීම වළක්වන්න බැහැ. තමන්ගෙ දරුවා හොඳ පාසලකට ඇතුළත් කර ගන්න නොහැකිවන ඕනෑම මාපියෙකුට මේ ක්‍රමය ගැන ඇති වෙන්නෙ වෛරයක්. මේ තත්ත්වය අසාධාරණයි. හැම අවුරුද්දෙම මගෙන් ලියුම් ඉල්ලගෙන එනවා. මේ ලියුම් දුන්නාම මගෙන් ලියුම ගන්න බැරි තවත් වාසනාවන්ත දරුවකුට මම කරන්නේ මොන තරම් අසාධාරණයක්ද? පාසලට අල්ලපු වැටේ ජීවත් වන දරුවාට යන්න බැරි වුණාට මොන ක්‍රමයකින් හෝ පාසලට ඇතුල් වෙන පිට පළාත්වල දරුවෝ මේ පාසලින් ඉගෙන ගන්නවා. අධ්‍යාපනය නිදහස් වගේම අධ්‍යාපනය ලබන්න ඇති අයිතියත් නිදහස් වෙන්න අවශ්‍යයි.

ළමයෙකු පාසලට තෝරා ගන්නෙ කොහොමද කියන එක අපි හැමදෙනකුටම පැහැදිලිව පෙනෙන්න අවශ්‍යයි.

සමහර වෙලාවට පාසල අසල පදිංචිව ඉන්න කෙනෙකුට පදිංචිය තහවුරු කරන්න බැහැ. කොළඹ නගරයේ ජීවත්වෙන අඩු ආදායම් ලබන පවුල්වල වැඩි දෙනෙකු අද මුහුණදෙන ප්‍රශ්නයක් මෙය. කුඩා නිවෙසක ඉතාම සීමිත පහසුකම් ඇතිව ඉන්න මේ පවුල්වල එකම බලාපොරොත්තුව තමන්ගේ දරුවා මේ සමාජයෙන් ඈත්කර හොඳ අනාගතයක් සකස් කිරීමයි. එයට ඇති එකම අවස්ථාව අධ්‍යාපනයක් ලබාගැනීම විතරයි. පවතින ක්‍රමය නිසා ඒකටත් ඉඩ නැතිනම් මවුපියන්ට ඇතිවන හැඟීම බරපතළ බව අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ.

මම මේ ගැන අධ්‍යාපන ඇමැතිවරයා එක්ක කතා කරන්න බලාපොරොත්තු වෙනවා. ඉඩමක අයිතිය නැති, අනවසර තැනක දැන් අවුරුදු ගණනක් ඉන්න පුද්ගලයකුට දරුවා පාසලට ඇතුළත් කර ගන්න නිසි වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. මට දැන් කිහිප දෙනෙක් කීවා කාඩ් එකක් දෙනවා. ඒ කාඩ් එකට ලකුණු අඩුවෙනවා කියලා. ඇත්ත. ස්ථිර ඉඩම් හිමි අයකුට ඇති අයිතිය අනවසර අයට දෙන්න පහසු නැහැ. නමුත් මේ දරු පවුල් පරම්පරාවක් තිස්සේ මේ ඉඩම්වල ජීවත්වන අය. මේවායේම ඉපදිලා, මේ වතුවලම අවසන් හුස්ම හෙලන පිරිස. මේ සමාජයේ කොටස්කරුවන් ඡන්දයේදී රවටලා ඉන් පස්සේ අමතක කරන්න අපි කැමැති නැහැ.



එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ නගරාධිපති ධුර අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා කොළඹ මෝදර ප්‍රදේශයේ ජනතාව හමුවී ඔවුන්ගේ ගැටලු පිළිබඳව ඉකුත්දා සාකච්ඡා කළේය. රජය සමග එකතු වී වැඩ කළ හැකි නගර සභාවක් කොළඹට තෝරා පත් කරන්නැයිද ජනතා ප්‍රශ්න හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම තම මූලික අරමුණ බවද මිලින්ද මොරගොඩ මහතා එහිදී පැවැසීය. ඒ මහතා ජනතාව හමුවීමට පැමිණි අයුරු ඡායාරූපයෙන් දැක්වේ. මෙම සාකච්ඡාවට නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතාද සහභාගි විය.

ඡවට්ලිකාර දේශපාලනය වෙනුවට ප්‍රතිපත්ති දේශපාලනයට මම උනන්දු වෙනවා.

මේ ඉන්න පිරිස ඉවත් කරලා නගරයේ ප්‍රශ්න විසඳන්න බලාපොරොත්තුවක් නැති බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පැහැදිලිව ප්‍රකාශ කළා. රජය සමග එකතුවී කොළඹ නගරයේ ගෙවල් තිස්පන් දහසකින් සමන්විත මහල් නිවාස පද්ධතියක් හදන්න රජය සැලසුම් කරලා අවසන්. මේ නිවාසවලට පදිංචියට යන සත්‍ය පිරිස හඳුනාගැනීමේ සමීක්ෂණ දැන් පවත්වලා අවසන්.

එක කුඩා නිවෙසක පවුල් දෙක තුන ඉන්න බව ඔප්පු වෙලා තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය නිවාස ගැන සමීක්ෂණ කරන කොට ගෙවල්වලින් පන්නන්න ලේබල් අලවනවා කියලා කට කතා යවනවා. මේ සමාජයේ හැටි එහෙමයි. රජයේ නිවාස වැඩ සටහන අනුව මේ සියලු දෙනාටම අභිමානයෙන් ජීවත් වන්න පුළුවන් නිවෙසක උරුමය ලබා දෙනවා. ඒ අනුව දරුවන්ගේ පාසල් ප්‍රශ්නය ස්ථිරව විසඳන්න පුළුවන් වේවි. වත්තේ නම කියන විට දරුවා පාසලට නොගන්න සංස්කෘතිය අමතක කරන්න පුළුවන් විදියට අපි අනාගතය ගොඩ නගන්න අවශ්‍යයි.

ඒ විතරක් නෙවෙයි.

සමාජයක් වශයෙන් අපි හැමදෙනෙක්ම නගරයේ යහපත වෙනුවෙන් සම්බන්ධ වෙන්න අවශ්‍යයි. ඡන්දය දීලා නියෝජිතයන් පත්කළාට පස්සේ නගර සභාව අමතක කරන එක වැරැදියි. අපි හැමදෙනාම තමන්ට අවශ්‍ය දේ කරගන්න එකතුවී එකමුතු විය යුතුයි. පුලුවන් දේ කරන්න මම උත්සාහ කළා. සහන සෙවණ වැඩපිළිවෙළ එයින් එකක්.

නැගෙනහිර හා බටහිර කොළඹ මැතිවරණ කොට්ඨාසවල ස්ථිර ග්‍රාම නිලධාරී කාර්යාල මම ඉදිකළා. තවමත් ඒවා පවතිනවා. මෙයට කලින් ග්‍රාම නිලධාරී කාර්යාලයට ස්ථිර තැනක් ලැබුණෙ නැහැ.

මගේ අදහස වුණේ රජයේ සරලම යාන්ත්‍රණය මහජනතාවට සමීප කරන්න. ඒ වගේම ග්‍රාම නිලධාරී මට්ටමින් පුරවැසි කමිටු හදන්න මම කැමැතියි. පුරවැසි කමිටුව නියෝජනය කරන්නේ සමාජයේ ගරු කරන කණ්ඩායම.

ආර්ථික වශයෙන් ශක්තිමත් කරන වැඩපිළිවෙළක් එතුමා ඉදිරිපත් කරනවා. රජය සමග එකතු වී නගරයට අලුත් දැක්මක් දෙන්න අප සූදානම් යනුවෙන්ද මිලින්ද මොරගොඩ මහතා පැවසීය. දින සියයක කඩිනම් වැඩසටහනක් සහ වසර හතරක දර්ශනයක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අප සමග අදහස් හුවමාරු කරගෙන එක්සත් ජනතා නිදහස් සන්ධාන නගර සභාවක් කොළඹ පත් කරන්නට එකතු වන්නැයිද හෙතෙම මෙහිදී ඉල්ලා සිටියේය.